**ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය (පෞද්ගලික) සමාගම - 2020**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය (පෞද්ගලික) සමාගමේ ("සමාගම") 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් කුඩා හා මධ්‍ය පරිමාණ අස්තිත්වයන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණ අස්තිත්වයන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශනවලට අනුව 2020 දෙසැම්බර් 31 දිනට දේපළ, පිරියත හා උපකරණවල පිරිවැය, සමුච්චිත ක්ෂය, සහ ශුද්ධ ස්ථාවර වත්කම් පිළිවෙලින් රු. 19,519,710 ක්, රු. 14,779,590 ක් සහ රු. 4,740,120 ක් විය. සමාගම ස්ථාවර වත්කම් ලේඛනය හා විස්තරාත්මක උපලේඛන නිසි පරිදි පවත්වාගෙන ගොස් නොතිබූ බැවින් එම ශේෂයන්හි නිරවද්‍යතාවය විගණනයට තහවුරු කරගැනීමට නොහැකි විය. | ශ්‍රී ලංකා ස(ර්)ට් (Sri Lanka CERT) විසින් පවත්වාගෙන යන වත්මන් ස්ථාවර වත්කම් ලේඛනය තුළ මිලදී ගත් වර්ෂය හා දිනය, අයිතම විස්තරය, වටිනාකම, සහ සැපයුම්කරු යන කරුණු ඇතුළත් වේ. | සමාගම ස්ථාවර වත්කම් ලේඛනය පවත්වාගෙන යා යුතු අතර ස්ථාවර වත්කම්හි නිරවද්‍යතාවය තහවුරු කළ යුතු වේ. |
| (ආ) | සමාගම අස්පෘශ්‍ය වත්කම් සම්බන්ධයෙන් විස්තරාත්මක උපලේඛන පවත්වාගෙන ගොස් නොතිබුණි. එබැවින් සමාලෝචිත වර්ෂය අවසානයේදී පැවති සම්පූර්ණයෙන්ම ක්ෂය වූ අස්පෘශ්‍ය වත්කම් සහ අස්පෘශ්‍ය වත්කම් සංයුතිය විගණනයේදී තහවුරු කරගැනීමට නොහැකි විය. | ශ්‍රී ලංකා ස(ර්)ට් (Sri Lanka CERT) විසින් අස්පෘශ්‍ය වත්කම් සම්බන්ධයෙන් විස්තරාත්මක උපලේඛනයක් පවත්වාගෙන යාම 2021 වර්ෂයේ සිට ආරම්භ කර ඇත. | සමාගම වත්කම් සම්බන්ධයෙන් විස්තරාත්මක උපලේඛන පවත්වාගෙන යා යුතු වේ. |
| (ඇ) | සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව 2020 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයෙන් අයවිය යුතු මුදල රු. 40,215,928 ක් විය. අදාළ ශේෂ තහවුරු කිරීම 2022 අප්‍රේල් දක්වාම ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයෙන් විගණනයට නොලැබුණ බැවින් එම ශේෂයන්හි නිරවද්‍යතාවය විගණනයට තහවුරු කරගැනීමට නොහැකි විය. | මෙම ගැටළුව සම්බන්ධයෙන් ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) සමඟ සාකච්ඡා කරමින් පවතින අතර, ආයතන දෙකම එකම අමාත්‍යාංශයක් යටතේ පවතින බැවින් රේඛීය අමාත්‍යාංශයේ සහාය ඇතිව නුදුරු අනාගතයේදීම මෙම ගැටළුව නිරවුල් කිරීමට හැකිවනු ඇත. | නිවැරදි අගය ගිණුම්ගත කළ යුතු වේ. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2003 ජූනි 02 දිනැති පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය - මාර්ගෝපදේශ අංක 9.2 සහ 9.3.1 | අනුමත කාර්ය මණ්ඩලයක් සහිත අනුමත සංවිධාන සටහනක් සමාගම සතුව නොපවතින අතර සෑම තනතුරක් සඳහාම බඳවාගැනීමේ හා උසස් කිරීමේ ක්‍රමවේදයක් සමාගම සතුව නොමැත. | දැනට අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහිත සංවිධාන සටහනක් ශ්‍රී ලංකා ස(ර්)ට් (Sri Lanka CERT) සතුව පවතී. නුදුරු අනාගතයේදීම ශ්‍රී ලංකා ස(ර්)ට් ආයතනය, සයිබ‍ආරක්ෂණ (ර්) නියෝජිතායතනයේ (Cyber Security Agency (CSA)) කොටසක් බවට පත් කිරීමට නියමිතය. සයිබ‍ආරක්ෂණ (ර්) නියෝජිතායතනය (CSA) ස්ථාපිත කිරීමට අදාළ පනත් කෙටුම්පත අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇති අතර, එය අනුමත වූ විගස ශ්‍රී ලංකා ස(ර්)ට් ආයතනයද ඇතුළුව සයිබ‍ආරක්ෂණ (ර්) නියෝජිතායතනයේ (CSA) සංවිධාන සටහන සඳහා අනුමැතිය ලැබේ. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 436,581 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 15,905,753 ක් විය. ඒ අනුව, මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 15,469,172 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට, ප්‍රදාන ලැබීම් හා වෙනත් ආදායම් පිළිවෙලින් රු. 8,403,612 කින් හා රු. 10,424,251 කින් අඩුවීම හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළදී ප්‍රධාන විධායක නිලධාරියාගේ දීමනා වශයෙන් රු. 8,520,000 ක මුදලක් ගෙවා තිබුණි. කෙසේ වුවද, ගෙවීම සඳහා අනුමැතිය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ශ්‍රී ලංකා ස(ර්)ට් (Sri Lanka CERT) විසින් අදාළ ලියවිලි ඉදිරිපත් කර ඇත . | ගෙවීම් සඳහා අනුමැතිය විගණනයට ඉදිරිපත් කළ යුතු වේ. |

## 3.2 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජාතික සයිබ (ර්)ආරක්ෂණ මෙහෙයුම් මධ්‍යස්ථාන ව්‍යාපෘතියේ (National Cyber Security Operations Centre (NSSOC) project) ව්‍යාපෘති කාලසීමාව 2016 සිට 2018 දක්වා වූ අතර එය 2021 දක්වා දීර්ඝ කර තිබුණි. කෙසේ වුවද, වසර 5ක කාලයක් ගතව තිබුනද 2020 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 47ක් පමණක් විය. | මෙම ව්‍යාපෘතිය ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය විසින් ආරම්භ කරන ලද අතර පසුව 2018 ඔක්තෝබර් 17 දින එය ශ්‍රී ලංකා ස(ර්)ට් (Sri Lanka CERT) වෙත පවරන ලදී. ශ්‍රී ලංකා ස(ර්)ට් ආයතනය 2019 වසර අගදී ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කරන ලදී. කෙසේ වුවද, 2020 වර්ෂයේදී සිදු වූ අමාත්‍ය වෙනස්වීම් හේතුවෙන් මේ සඳහා පත් කරන ලද ප්‍රසම්පාදන කමිටු අහෝසි වූ අතර ඇතැම් ප්‍රසම්පාදන ප්‍රදානය කිරීමට නොහැකි විය. | අපේක්ෂිත කාල පරිච්ඡේදය තුළ ව්‍යාපෘතිය නිම කළ යුතු වේ. |
| (ආ) | තොරතුරු සහ සයිබආරක්ෂණය (ර්) පිලිබඳ ජාතික සමීක්ෂණය ව්‍යාපෘතිය 2019 සිට 2020 දක්වා වූ කාල පරිච්ඡේදය තුළ අවසන් කිරීමට නියමිතව තිබුණිකෙසේ වුවද ., 2020 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 80 ක් පමණක් වූ අතර නියමිත පරිදි එය අවසන් කර නොතිබුණි. | ජාතික සමීක්ෂණ සහ සයිබ (ර්) ආරක්ෂණය යන තේමාව යටතේ, සමීක්ෂණ 04 ක් 2019 සිට 2020 දක්වා වූ කාල පරිච්ඡේදය තුළ නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වුවද, ඉන් එක් ව්‍යාපෘතියක් සම්පත් හිඟය හා කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් අවසන් කිරීමට නොහැකි විය. ඉතිරි ව්‍යාපෘති 03, 2021 වර්ෂය තුළදී සාර්ථකව නිම කර ඇත. | අපේක්ෂිත කාල පරිච්ඡේදය තුළ ව්‍යාපෘතිය නිම කළ යුතු වේ. |